තුන්වන වාර පරීක්ෂණය - 2016 ජූලි

කෘෂි විද්‍යාව I | **12 ශ්‍රේණිය** | **පැය දෙකයි**

සැලකිය යුතුයි :

* සියලු ම ප්‍රශ්න වලට පිළිතුරු සපයන්න.
* උත්තර පත්‍රයේ නියමිත ස්ථානයේ ඔබේ නම ලියන්න.
* 1 සිට 50 තෙක් වූ එක් එක් ප්‍රශ්නයට (1), (2), (3), (4), (5) යන පිළිතුරු වලින් නිවැරදි හෝ ඉතාමත් ගැලපෙන හෝ පිළිතුර තෝරා ගෙන එය **උත්තර පත්‍රයේ දක්වෙන උපදෙස් පරිදි කතිරයක් (x) යොදා දක්වන්න.**

1. ශ්‍රී ලංකාවේ වර්තමාන දළ ජාතික නිෂ්පාදනයට කෘෂි කර්මාන්තයේ දායකත්වය දළ වශයෙන්,

   1) 10% කි. 2) 20% කි. 3) 30% කි.
   4) 40% කි. 5) 50% කි.

2. ඔබ පාසලේ කාලගුණික මධ්‍යස්ථානයේ, සාපේක්ෂ ආර්ද්‍රතාවය මැනීම සඳහා යොදාගන්නා උපකරණ වනුයේ,

   1) වාෂ්පීකරණ තැටියයි. 2) ආර්ද්‍රතාමානයයි.
   3) තෙත් හා වියළි බල්බ උෂ්නත්වමානයයි. 4) අනිලමානයයි.
   5) උපරිම හා අවම උෂ්ණත්වමානයයි.

3. තෙත් කලාපයේ වාර්ෂික අවම වර්ෂාපතනය හා වර්ෂාව ලැබෙන ආසන්න දින සංඛ්‍යාව පිළිවෙලින් පෙන්නුම් කරන පිළිතුර වනුයේ.

   1) මි.මි. 1750 හා දින 220 කි. 2) මි.මි. 2500 හා දින 180 කි.
   3) මි.මි. 2500 හා දින 145 කි. 4) මි.මි. 2500 හා දින 220 කි.
   5) මි.මි. 1750 හා දින 145 කි.

4. නවීනතම වර්ගීකරණයට අනුව ශ්‍රී ලංකාවේ කෘෂි පාරිසරික කලාප,

   1) 03 ක් තිබේ 2) 07 ක් තිබේ 3) 09 ක් තිබේ 4) 24 ක් තිබේ 5) 46 ක් තිබේ

5. දිගු දිවා ශාක
   1) දිවා කාලය අවධි දිවා දිගට වඩා දීර්ඝ වූ විට මල් හට ගනී
   2) දිවා කාලය අවධි දිවා දිගට වඩා කෙටි වූ විට මල් හට ගනී
   3) ශ්‍රී ලංකාව වැනි රටවල දක්නට නොලැබේ
   4) දිගු වර්ධක අවධියකින් පසුව මල් හට ගැනීම උත්තේජනය වේ
   5) දිගු දිවා කාලයක් පවතින ප්‍රදේශවල පමණක් වගා කළ හැකි ශාක වේ

6. දර්ශීය පාංශු පැතිකඩක Aoo වන්නේ,

   1) පැසෙමින් පවතින කාබනික ද්‍රව්‍ය ස්ථරයයි
   2) හියුමස් අඩංගු ස්ථරයයි
   3) සංක්‍රාමි කලාපයයි
   4) ඉල්ලුවියල් කලාපයයි
   5) ඓන්ද්‍රීය ද්‍රව්‍යයයි

7. පසක ක්ෂේත්‍ර ධාරිතාවයේදී pF අගය වන්නේ

1) 4.2 2) 4.6 3) 7 4) 2.5 5) 2

8. පාංශු වයනය මත රඳා පවතින සාධකයකි

1) පාංශු වාතය හා පාංශු ගැඹුර
2) පාංශු ව්‍යුහය හා පාංශු ගැඹුර
3) පාංශු ජලය හා පාංශු වාතය
4) පාංශු ගැඹුර හා කලිල ප්‍රමාණය
5) පාංශු pH අගය හා කලිල ප්‍රමාණය

9. ලංකාවේ වැඩි වශයෙන්ම දැක ගත හැකි විපරීත පාෂාණ වර්ගයකි

1) පෙග්මටයිට් 2) ග්‍රැනයිට් 3) නයිස්
4) චානොකයිට් 5) මොන්ට්මොරිලොනයිට්

10. පාංශු ජනනය වීමේ ක්‍රියාවලියක් ලෙස සැලකිය නොහැක්කේ,

1) පොඩ්සලීකරනය
2) ලැටරිකරනය
3) කිලේටකරනය
4) චූර්නීකරනය
5) ලවනීකරනය

11. වගා ක්ෂේත්‍රයක ශුද්ධ ජල අවශ්‍යතාවය හෙක්ටයාරයකට ඝන මීටර් 1500 කි. ජල හානිපූරණයට 25% ක් වැඩි පුර ජලය එක්කල විට මුළු ජල අවශ්‍යතාවය හෙක්ටයාරයකට ඝන මීටර්,

1) 1125 3) 1925 5) 2115
2) 1875 4) 2000

12. විවිධ ප්‍රදේශවල වර්ෂාපතනයන් වෙන වෙනම ප්‍රස්ථාර ගත කර ඇති අවස්ථාවක ද්විත්ව ආකාරයේ වර්ෂාපතන රටාවක් පෙන්වන ප්‍රදේශ ඇතුලත් පිළිතුර වනුයේ,

1) අනුරාධපුර, මොණරාගල හා කොළඹ
2) යාපනය, නුවරඑළිය හා කොළඹ
3) නුවරඑළිය, කෑගල්ල හා ගාල්ල
4) රත්නපුර, බදුල්ල හා යාපනුව
5) පොළොන්නරුව, බදුල්ල හා රත්නපුර

13. පරිනත පත්‍රවල හා ළපටි පත්‍රවල අන්තර් නාරටි හරිතක්ෂයට හේතුවන පරිදි ඌන විය හැකි පෝෂක මූල ද්‍රව්‍ය යුගල පිළිවෙලින් වනුයේ,

1) N හා S 2) S හා N 3) Mg හා Fe
4) Fe හා Mg 5) Mg හා S

14. එක්තරා භෝගයක වර්ධනය සඳහා අවශ්‍ය මුළු නයිට්‍රජන් ප්‍රමාණය 240 Kg/ha ලෙස ගණනය කර ඇත. පොහොර භාවිත කාර්යක්ෂමතාවය 50% වූ විට භෝගය සඳහා බාහිරින් නයිට්‍රජන් 300 kg ලැබෙන පරිදි එම ක්ෂේත්‍රයට පොහොර යෙදීමට ගොවියාට සිදුවිය. එසේ නම් පොහොර යෙදීමට පෙර පසෙහි ලබා ගත හැකි නයිට්‍රජන් ප්‍රමාණය කොපමණ වන්නේද ?

1) 60 kg 2) 120 kg 3) 180 kg 4) 90 kg 5) 0 kg

15. කිරි උණ පිළිබඳව වඩාත් නිවැරදි වගන්තිය වනුයේ

1) ගවයින්ට වැළදෙන පරිවෘත්තීය රෝගයකි.
2) එළුවන්ට වැළදෙන පරපෝෂී රෝගයකි.
3) ගවයින්ට වැළදෙන වෛරස් රෝගයකි.
4) එළුවන්ට වැළදෙන පරිවෘත්තීය රෝගයකි.
5) ඌරන්ට වැළදෙන පරපෝෂී රෝගයකි.

16. ගොවිපළ සතුන්ගේ මදය පිළිබඳව නිවැරදි වගන්තිය වනුයේ,
   1) මදය ආරම්භයේදී ඩිම්බ මෝචනය වේ.
   2) මදය අවධියේදී ඊස්ට්‍රජන් හෝමෝනය ඉතා අඩු සාන්ද්‍රණයකින් පවතී.
   3) මදය අවධියේදී ප්‍රොජෙස්ටරෝන් හෝමෝනය උපරිම සාන්ද්‍රණයකින් පවතී.
   4) මදය අවධියේදී ඊස්ට්‍රජන් FSH හා LH හෝමෝනය උපරිම සාන්ද්‍රණයකින් පවතී.
   5) මදය අවධියේදී කෘතිම සිංචනය සිදුකිරීම තුලින් සාර්ථක ප්‍රතිඵල ලැබිය නොහැක.

17. සයිලේජ පිළිබඳව නිවැරදි පිළිතුර වනුයේ,

A - සයිලෝව තුල ශාක කොටස් හොඳින් ඇසිරීම තුලින් ස්වායු පැසීම සිදු වේ.

B - නිපදවූ සයිලේජවල ප්‍රසන්න සුවඳ සඳහා එහි ලැක්ටික් අම්ලය තිබීම වැදගත් වේ.

C - පාලනය කරන ලද තත්ත්ව යටතේ පැසීමට භාජනය කරන ලද ශාක කොටස් ඇසුරින් නිපදවන ලද ගුණාත්මක මෘදු ආහාරයක් ලෙස සයිලේජ හැඳින්විය හැක.

   1) AB   2) AC   3) BC
   4) ABC   5) කිසිවක් නිවැරදි නොවේ

18. වර්ධක කුකුලන්ගේ ආහාර සලාකයක අඩංගු විය යුතු දළ තන්තු ප්‍රමාණය වනුයේ,
   1) 5% - 7%
   2) 10%
   3) 7% - 10%
   4) 3% ට අඩුය
   5) කුකුලන්ගේ ආහාර සලාකවල දල තන්තු අඩංගු කළ නොහැක.

19. ඇමරිකන් සම්භවයක් සහිත ද්විකාර්ය්‍ය කුකුල් වර්ගයක් වනුයේ,

   1) ඔස්ට්‍රලොප්   2) ලෙගෝන්   3) RIR   4) බ්‍රහ්මා   5) ලෝමාන්

20. බිත්තර දමන කිකිළියන් පාලනයේදී පිටලෑම සිදු නොකරන අවස්ථාවක් වන්නේ,
   1) දිනක් වයසැති අවස්ථාවේදී
   2) හොට කපන අවස්ථාවේදී
   3) බෲඩරයෙන් ඉවත් කරන අවස්ථාවේදී
   4) බිත්තර දමන අවධියේදී
   5) වර්ධක අවධියේදී

21. පාංශු පෝෂක සුලභතාවය කෙරෙහි බලපාන සාධක පමණක් අඩංගු පිළිතුර වනුයේ,
   1) පාංශු pH, පාංශු ජීවීන්, පාංශු ආර්ද්‍රතාවය.
   2) පාංශු වාතය, පාංශු උෂ්ණත්වය, පාංශු වාතනය.
   3) පාංශු pH, පාංශු උෂ්ණත්වය, පාංශු කලිල.
   4) පාංශු pH, පාංශු තෙතමනය, පාංශු ජීවීන්.
   5) පාංශු වාතය, පාංශු තෙතමනය, පාංශු ජීවීන්.

22. ද්විතියික බිම් සැකසීමේ උපකරණ පමණක් අයත් පිළිතුර වනුයේ,

a	- තැටි නගුල	b	- මෝල්බෝඩ් නගුල
c	- උදැල්ල	d	- තැටි පෝරුව
e	- රිජරය	f	- රොටවේටරය

   1) a,b,c,d   2) a,b,d,f   3) b,c,e,f   4) c,d,e,f   5) b,c,d,e

23. Mg ඌනතාවයේ ලක්ෂණ අඩංගු පිළිතුර වනුයේ ,

1) ඌනතා ලක්ෂණ ලපටි පත්‍ර වල මෙන්ම පරිණත පත්‍රවලද දැකගත හැකිය.
2) ලපටි පත්‍ර වල අන්තර් නාරටි හරිතක්ෂය ඇති වේ.
3) ලපටි පත්‍ර මැලවේ. ශාක අග්‍රස්ථයේ පසු මැරීමක් ඇත.
4) විවිධ ආකාර හරිතක්ෂ රටා හා නෙක්රොසීය ලප නාරටි අතර ඇතිවේ.
5) පරිණත පත්‍ර වල අන්තර් නාරටි හරිතක්ෂය ඇතිවේ.

24. පාංශු හායනය කෙරෙහි බලපාන සාධක අඩංගු පිළිතුර වනුයේ,

A - භූමි භාවිත වර්ගීකරණයට අනුකූලව භූමි පරිහරණය
B - අවිධිමත් භෝග වගා ක්‍රම
C - භූගත ජලය වාරි ජලය ලෙස භාවිතය
D - පොහොර භාවිතා නොකරමින් ඒක වගා පවත්වාගෙන යාම

1) AB 2) BC 3) CD 4) ABD 5) BCD

25. කෙටි කාලයක් තුළ යම් ආයතනයක, නිෂ්පාදනය වැඩි කිරීමත් සමගම සාමාන්‍ය ස්ථාවර පිරිවැය

1) වැඩිවේ
2) අඩුවේ
3) පළමුව වැඩිවී පසුව අඩුවේ
4) පළමුව අඩුවී පසුව වැඩිවේ
5) පළමුව වැඩිවී පසුව නියත වේ

26. නිෂ්පාදන ප්‍රමානය x ඒකක මිල මගින් ලැබෙන්නේ,

1) ආන්තික ආදායම
2) මුළු ආදායම
3) සාමාන්‍ය ආදායම
4) මුළු ලාභය
5) සාමාන්‍ය ලාභය

27. උදාසීන වක්‍රයකින්,

1) භාණ්ඩ පරිභෝජනයත් සමග උපයෝගීතාවයේ විචලනය දක්වයි.
2) පාරිභෝගිකයෙකුගේ උපයෝගීතාවයේ විචලනය පෙන්නුම් කරයි.
3) එකම උපයෝගීතාවයක් ලබාදෙන භාණ්ඩ සංයෝජනය දක්වයි.
4) සම ආන්තික උපයෝගීතා න්‍යායට අනුව ආදායම් බෙදී යාම විස්තර කරයි.
5) භාණ්ඩ පරිභෝජනයට අදාලව ගෘහස්තකයෙකුගේ උපරිම තෘප්ති මට්ටම දක්වයි.

28. ඉල්ලුම් නම්‍යතාවය පිළිබඳව වඩාත් නිරවද්‍ය වගන්තිය වන්නේ,

1) මිලෙහි වෙනසකට අනුකූලව ඉල්ලුම් ප්‍රමාණය දක්වන සංවේදීතාවය ඉල්ලුම් නම්‍යතාවය නම් වේ.
2) ඉල්ලුමේ වෙනසකට අනුකූලව සැපයුම් ප්‍රමාණය දක්වන සංවේදීතාවය ඉල්ලුම් නම්‍යතාවය නම් වේ.
3) පූර්ණ අනම්‍ය ඉල්ලුම් නම්‍යතාවයක් ඇති විටකදී එකම මිලට වෙනස්වන ප්‍රමාණ ඉල්ලීමට පාරිභෝගිකයන් සූදානම් ය.
4) පූර්ණ නම්‍ය ඉල්ලුමට උදාහරණ ලෙස ලදරු භාණ්ඩ හා ලදරු කිරිපිටි දැක්විය හැකිය.
5) ඉහත පිළිතුරු සියල්ල නිවැරදිය.

29. සැපයුම වැඩිවීමට තුඩුදෙන කරුණක් නොවන්නේ,

1) අනෙකුත් භාණ්ඩවල මිලේ අඩු වීම.
2) භාණ්ඩය නිපදවීමට යොදන නිෂ්පාදන සාධකවල මිල සාපේක්ෂව අඩුය.
3) භාණ්ඩයේ නිෂ්පාදන ශිල්ප ක්‍රම දියුණුව.
4) භාණ්ඩ මත පැනවී ඇති අලෙවි බදු වැඩි කිරීම.
5) එම භාණ්ඩය වෙනුවෙන් පනවා ඇති නිෂ්පාදන සහනාධාර වැඩි කිරීම.

30. ආදේශක හා අනුපූරක භාණ්ඩ සඳහා උදාහරණ පිළිවෙලින් දක්වා ඇති පිළිතුර වනුයේ,
1) තේ හා කෝපි සන්ලයිට් හා ලක්ස් යන සබන් වර්ග.
2) ලක්ස් හා කොහොඹ යන සබන් වර්ග බයිසිකල් ටයර් හා ටියුබ්.
3) ලක්ස් හා කොහොඹ යන සබන් වර්ග බත් හා පාන්.
4) බත් හා පාන් බයිසිකලය හා දුම්රිය.
5) තීන්ත හා පෑන් තීන්ත පෑන හා බෝල් පොයින්ට් පෑන.

31. කාබනික පොහොර පිළිබඳව වඩාත් නිවැරදි පිළිතුර වන්නේ,

1) ක්ෂේත්‍රයට අමු කොළ පොහොර යෙදීමට වඩාත් සුදුසු අවස්ථාව වන්නේ බිම් සැකසීම අවසානයේ ශාක වගා කිරීම සිදු කරන අවස්ථාවේදීය.
2) කොම්පෝස්ට් කිරීම යනු මිනිසාගේ මැදිහත් වීමෙන් හෝ නොවීමෙන් පාලනය වූ තත්ත්වයක් යටතේ කාබනික ද්‍රව්‍ය ජීර්ණය වීමයි.
3) N,P හා K යන ප්‍රධාන පෝෂක තුන්වර්ගයම වැඩි වශයෙන්ම අයත් ගොවිපළ පොහොර වර්ගය ලෙස කුකුල් පොහොර හැඳින්විය හැක.
4) කාබනික දියර පොහොර සකසා එය ජලය හා මිශ්‍ර කර ශාක මුලට යෙදීම පමණක් සිදු කිරීමෙන් වඩාත් හොඳ පෝෂණයක් ශාකවලට ලබා දිය හැකිය.
5) ඇසොල්ලා යනු පර්නාංග ශාකයක් වන අතර එය වායුගෝලීය නයිට්‍රජන් තිර කිරීම සිදු කරයි.

32. පහත දැක්වෙනුයේ බීජ වල ඇතිවිය හැකි සුප්තතා ආකාර හා එම සුප්තතාවය කෙරේ බලපාන සාධක වේ. එම තොරතුරු ඇසුරෙන් සාවද්‍ය කරුණු අඩංගු පිළිතුර වනුයේ,

	සුප්තතා ආකාර	සුප්තතාවය කෙරේ බලපාන සාධක
a.	භෞතික සුප්තතාවය	තද බීජාවරණය
b.	රසායනික සුප්තතාවය	ප්‍රරෝහණ නිශේධන පැවතීම
c.	රූපාණු විද්‍යාත්මක සුප්තතාවය	අපාරගම්‍ය බීජාවරණය
d.	කායික විද්‍යාත්මක සුප්තතාවය	අල්ප විකසිත කලලය
e.	පැවරූ සුප්තතාවය	ප්‍රරෝහණයට අවශ්‍යය තත්ත්ව ලබා නොදීම

33. බීජ ප්‍රරෝහණය සම්බන්ධව පහත දී ඇති වගන්ති අතුරින් වඩාත් නිරවද්‍ය වගන්තිය වනුයේ ,

A. අධෝභෞම ප්‍රරෝහණයේදී බීජෝපරියේ වර්ධන වේගයට වඩා බීජාධරයේ වර්ධන වේගය වැඩිය සිදුවේ.
B. අපිභෞම ප්‍රරෝහණයේදී බීජාධරය වඩා වැඩි වේගයෙන් වර්ධනය වේ.
C. අපිභෞම ප්‍රරෝහණය සිදුවන බීජවල බීජ පත්‍ර මුල් අවධියේ බීජ පැලයේ වර්ධනයට අවශ්‍ය සංචිත ආහාර ලබාදීමට අමතරව ප්‍රභාසංස්ලේෂණය මගින්ද ආහාර නිපදවයි.
D. අධෝභෞම ප්‍රරෝහණය වැඩි වශයෙන් සිදුවන්නේ ඒක බීජ පත්‍රී බීජයන් ගේය.

1) A,B හා C
2) A,B හා D
3) B,C හා D
4) A,C හා D
5) A,B,C හා D ය

34. ශබ්ධාකර තබන බීජවල තිබිය යුතු වඩාත් සුදුසු තෙතමන ප්‍රතිශතය
1) 15% - 20% අතර වේ.
2) 5% - 14% අතර වේ.
3) 5% ට වඩා අඩු වේ.
4) 10% - 22% අතර වේ.
5) 5% ට වඩා වැඩි වේ.

35. බීජ ප්‍රතිකාර කිරීමේ ඇතැම් අරමුණු පහත දැක් වේ.

A. බීජ ආවරණය කිරීම.

B. අජීවී බීජ ඉවත් කිරීම.

C. රෝග හා පළිබෝධ අවමකර ගැනීම.

D. බීජ වියලීම .

1) A,B හා C
2) A,B හා D
3) B,C හා D
4) A,C හා D
5) A,B,C හා D ය

36. ශාක ප්‍රචාරණය පිළිබඳව වඩාත් නිරවද්‍ය වගන්තිය වනුයේ.

1) වර්ධක ප්‍රචාරණය මගින් ශාක අතර ප්‍රභේදනය වැඩි කළ හැක.
2) ශාක දෙමුහුම් කිරීම මගින් මව් ශාකයට බොහෝ දුරට සමාන ලක්ෂණ සහිත ශාක ලබා ගත හැකි වේ.
3) ශාක විකෘති හා බහු ගුණතාවය ඇති කිරීමෙන් ප්‍රභේදනය වැඩි කල හැකිය.
4) පටක රෝපණය මගින් බීජ වලින් තොර ඵල සහිත ශාක ලබා ගත හැකිය.
5) ලංකාවේ බෝග වගාවේදී බහුලව භාවිතාවන වර්ධක ප්‍රචාරණ ක්‍රමය පටක රෝපණයයි.

37. ස්ව පරාගනය පිළිබඳව වඩාත් නිරවද්‍ය වගන්තිය වනුයේ ,

1) පරාග කනිකා එම පරාග අයත් පුෂ්පයේම කලංකය මත වැටීම.
2) පරාග කනිකා එම ශාකය අයත් පරම්පරාවේ වෙනත් ඕනෑම ශාකයක කලංකය මත වැටීම.
3) පරාග කනිකා එම ශාකය අයත් විශේෂයේ වෙනත් ඕනෑම ශාකයක කලංකය මත වැටීම.
4) පරාග කනිකා එම පරාග අයත් පුෂ්පයේම හෝ වෙනත් එම ශාකයේම පුෂ්පයක කලංකය මත වැටීම.
5) ඉහත කිසිම කරුණක් නිරවද්‍ය නොවේ.

38. පුෂ්පවල පරාගනය වැලැක්වීම සඳහා ඇති අනුවර්තනයක් වන්නේ,

1) විෂමකීලතාවය
2) ස්ව අසංගතිය
3) යෝග බාධකතාවය
4) ද්වීගෘහීතාවය
5) සම පරිණතිය

39. බීජ ගබඩා කිරීම හා සම්බන්ධ අසත්‍ය ප්‍රකාශය වනුයේ,

1) ගබඩාවේ උෂ්ණත්වය හා ආර්ද්‍රතාවය අඩු මට්ටමක පවත්වාගත යුතුය.
2) බීජ නයිට්‍රජන් හා හයිඩ්‍රජන් වායු සහිත පරිසරවල ගබඩා කිරීම වඩා උචිතය.
3) වඩා හොඳ පාරිසරික තත්ත්ව වල ගබඩා කිරීම මගින් බීජවල ප්‍රවේණිකව තීරණය වූ ජීව කාලය වුවත් දීර්ඝ කළ හැකිය.
4) ශ්‍රී ලංකාවේ බණ්ඩාරවෙල ප්‍රදේශය බීජ ගබඩා කිරීම සඳහා යෝග්‍ය පාරිසරික සාධක වලින් යුක්තවූ ප්‍රදේශයකි.
5) ගබඩා කිරීම සඳහා බීජ මළු ඇසිරීමේදී විශාල ගොඩක් ලෙස ඇසිරීම සුදුසු නැත.

40. කුඩා ජල පහර වලින් ජලය එසවීමට භාවිතාකරන සම්ප්‍රදායික ක්‍රමයක් ක්‍රම වන්නේ,

A. බප්පි

B. පැද්දෙන ගොටුව

C. ආඩියා ලිඳ

D. දිය රෝදය

1) A පමණි
2) B පමණි
3) C පමණි
4) A හා C ය
5) B හා D ය

41. ගුරුත්වාකාරක නොවන ජල සම්පාදන ක්‍රමයක් වන්නේ,

1) බිංදු ජල සම්පාදනය.
2) උප පෘෂ්ඨීය ජල සම්පාදනය.
3) තීරු ජල සම්පාදනය.
4) ඇළි හා වැටි ජල සම්පාදනය.
5) බේසම් ක්‍රමය.

42. පසක දුර්වල ජල වහනයට හේතු ඇතුලත් පිළිතුර වන්නේ,

A. භූ ජල මට්ටම ඉහලින් පිහිටීම.
B. උප පස තද වීම.
C. විවිධ ගැඹුරු වලට සී සෑම සිදු කිරීම.
D. ලෝම පසක් පැවතීම.

1) A,B හා D 2) A හා D 3) A හා B 4) B,C හා D 5) C හා D

43 බීජවල පැවරු සුප්තතාවය ඇති වීමට හේතුවක් වනුයේ,
1) අල්ප විකසිත කලලය.
2) අක්‍රීය කලලයක් පැවතීම.
3) වියලි පරිසරයක බීජ තැබීම.
4) ආලෝකමත් පරිසරයක බීජ තැබීම.
5) ඝනකම් බීජාවරණයක් තිබීම.

44 සුළගේ වේගයට සාපේක්ෂව ශාකයක උත්ස්වේදන සීඝ්‍රතාවය වෙනස්වන ආකාරය පෙන්වන ප්‍රස්ථාරයක් වනුයේ,



(1) (2) (3) (4) (5)

45. බිම් සැකසීමෙන් පසු පසේ වෙනස් නොවන ලක්ෂණ වනුයේ,
1) ජලසන්නායකතාව
2) සත්‍ය ඝනත්වය
3) සච්ඡිද්‍රතාවය
4) අහඹු රළුබව
5) සංතෘප්ත අවස්ථාවේ පාංශු ජල %

46. සාමාන්‍ය බිම් සැකසීමේ ක්‍රමයකින් නැවත යථා තත්ත්වයට පත් කල නොහැකි පාංශු ඛාදන අවස්ථාව වන්නේ ,
1) ඇඟිලි ඛාදනය
2) විසිර ඛාදනය
3) ඇලි ඛාදනය
4) ස්ථරීය ඛාදනය
5) සුළං ඛාදනය

47. එක්තරා දිනක සම්මත වර්ශාමානයක් තුල එකතුවූ ජල ප්‍රමාණය 10 ක් විය එම ප්‍රදේශයට එදින ලැබුනු වර්ෂාපතනය උසක් ලෙස දැක්වෙන්නේ,
1)79 cm 2) 7.9 cm 3) 0.79 cm 4) 3.95 cm 5) 39.5 cm

48. වඩා වැඩි කාර්යක්ෂමතාවයකින් යුක්තව ක්‍රියාත්මකවන ප්‍රාථමික බිම් සකසන උපකරණය වනුයේ ,

1) හැඩ ලෑලි නඟුල
2) මෝල් බෝඩ් නඟුල
3) තැටි නඟුල
4) ජපන් පරිවර්ත්‍ය නඟුල
5) කොකු නඟුල

49. ආට්සියනු ජල සංචායක පිළිබඳ අසත්‍ය වගන්තිය වන්නේ,

1) අපාරගම්‍යය පාෂාණ ස්ථර 2ක් අතර පිහිටා ඇත.
2) මෙම ජලය රැඳී ඇත්තේ පීඩනයකින් යුක්තවය.
3) ජල සංචායකයේ මුව බොහෝ විට කඳුකර ජලාධාර ප්‍රදේශවල පවතී.
4) අපාරගම්‍යය පාෂාණ ස්ථර 2ක් අතර පිහිටා ඇතත් මෙහි ජලය පීඩනයකින් නොපවතී.
5) ජල සංචායකයේ මුව බොහෝ විට සානුවල පවතී.

50. ලෝක ආහාර හා කෘෂි කර්ම දිනය යෙදෙන්නේ,
1) ජනවාරි 15
2) ඔක්තෝම්බර් 16
3) නොවැම්බර් 2
4) නොවැම්බර් 16
5) දෙසැම්බර් 8

ඩී. එස්. සේනානායක විද්‍යාලය.. කොළඹ 07..

තුන්වන වාර පරීක්ෂණය - 2016 ජූලි

කෘෂි විද්‍යාව II

12ශ්‍රේණිය

පැය 2 1/2

නම : ....

ව්‍යුහගත රචනා

ප්‍රශ්න සියල්ලටම පිළිතුරු සපයන්න.

01. I.

a) ආර්ථිකයක නිෂ්පාදනය කරන භාණ්ඩ ප්‍රධාන වශයෙන් පාරිභෝගික භාණ්ඩ හා නිෂ්පාදනය භාණ්ඩ ලෙස කොටස් 2කි ඒම ආකාර 2ක අර්ථ ගන්වන්න.

පාරිභෝගික භාණ්ඩ -

....

....

නිෂ්පාදනය භාණ්ඩ -

....

....

b) නිෂ්පාදන ක්‍රියාවලිය සඳහා යොදා ගන්නා සාධක ලියන්න.

....

....

c) ඉහත සඳහන් නිෂ්පාදන සාධක අතුරින් එක් නිෂ්පාදන සාධකයක ලක්ෂණ 03 ක් සඳහන් කරන්න.

....

....

....

....

d) ශ්‍රම විභාජනය අර්ථ ගන්වන්න.

....

....

e) ශ්‍රම විභාජනයේ අවාසි 03 ක් ලියන්න.

....

....

....

II. a)භාණ්ඩයක ඉල්ලුම යන්න අර්ථ ගන්වන්න.

....

....

b) ඉල්ලුම කෙරෙහි බලපාන සාධක 04 ක් ලියන්න.

....

....

....

....

c) සැපයුම් න්‍යාය ලියන්න.

....

....

d) මිල යාන්ත්‍රණය මත ක්‍රියාත්මක වන වෙළඳ පළක් ඇති ආර්ථිකය කුමන නමකින් හඳුන්වයිද ?

....

....

e) එක්තරා භාණ්ඩයක ඉල්ලුම් හා සැපයුම් ශ්‍රිතයන් පහත ආකාර නම් වෙළඳපළේ එම භාණ්ඩයේ මිල සොයන්න.

$Qs = 15 + 2p$, $Qd = 100 - 10p$

....

....

....

....

....

III. a)දළ දේශීය නිෂ්පාදනය අර්ථ ගන්වන්න.

....

....

....

b) දළ දේශීය නිෂ්පාදනයට දායකත්වය දක්වන ප්‍රධාන අංශ 3 මොනවාද ?

....

....

....

c) සංවර්ධිත රටක දළ දේශීය නිෂ්පාදනයට ඉහළම දායකත්වය දක්වන අංශය කුමක්ද ?

....

d) කෘෂි සංවර්ධනයට වැදගත් වන රාජ්‍ය ආයතන 4 ක් ලියන්න.

....

....

....

....

The National e-learning Portal for the General Education

e) ඉහත ඔබ සඳහන් කළ එක් ආයතනයකින් ඉටුවන සේවා 3 ක් ලියන්න.

02. I.

a) යම් ප්‍රදේශයක දේශගුණය නිර්ණය කිරීම සඳහා වැදගත්වන කාලගුණික පරාමිතීන් ලියන්න.

b) ඉහත ඔබ සඳහන් කළ පරාමිතීන් මැනීමට භාවිතා කළ හැකි උපකරණ ලියන්න.

c) වර්ෂණය යන්න අර්ථ ගන්වන්න.

The National e-learning Portal for The General Education

d) ලංකාවට වැඩි වශයෙන් ලැබෙන වර්ෂණ ආකාරය කුමක්ද ?

e) ජල චක්‍රය තුල ක්‍රියාත්මක වන සංසිද්ධි මොනවාද ?

II. බෝග ශාකවල වර්ධනය හා සංවර්ධනය කෙරෙහි ආලෝකය ලැබීම ඉතා වැදගත් වේ.

a) ආලෝක තීව්‍රතාවය යන්න අර්ථ ගන්වන්න.

b) ආලෝක තීව්‍රතාවය බෝග වගාවට කුමණ ලෙස බලපායිද ?

....

....

....

c)



A හා B ශාක ආකාර නම් කරන්න.

A - ....

B - ....

d) ප්‍රකාශවර්තිතාවය යනු කුමක්ද ?

....

....

....

e) ශාක තුල ප්‍රකාශවර්තිතාවය කෙරෙහි බලපාන රසායනික ද්‍රව්‍යය කුමක්ද ?

....

The National e-learning Portal for The General Education

III.

a) පාෂාණ ඇසුරින් පස නිර්මාණය වීමේ සම්පූර්ණ ක්‍රියාවලිය පෙන්වීමට සමීකරණයක් ගොඩ නගන්න.

....

....

....

b) පාෂාණ ජීර්ණය වීමේ ප්‍රධාන ආකාර 02 ක් ලියන්න .

....

....

c) ඉහත ඔබ සඳහන් කළ එක් ක්‍රමයක් සඳහා බලපාන සාධක ලියන්න .

....

....

d) පසක අඩංගු ඛනිජ ප්‍රධාන ආකාර 02 ක ලියා ඒවාට උදාහරණ දෙන්න .

....

....

....

e) පාංශු ගැඹුර බෝග වගාවේදී වැදගත්වන ආකාරය කුමක්ද ?

....

....

....

03. I.



a) ඉහත රූප සටහනින් කුමන සතෙකුගේ කුමන පද්ධතිය නිරූපණය කරයිද ?

....

b) එම රූප සටහනේ A සිට G ලෙස දක්වා ඇති කොටස් නම් කරන්න.

....

....

....

....

c) C,D,F හා G යන කොටස්වල කාර්යයන් එකක් බැගින් ලියන්න.

....

....

....

....

d) ජායා සතුන්ගේ ප්‍රජනන ක්‍රියාවලියට බලපාන හෝමෝන වර්ග ලියන්න.

....

....

....

e) ජායා සතුන්ගේ මද ලක්‍ෂණ ලියන්න.

....

....

....

....

National e-learning Portal for the General Education

II.

a) ගොවිපළ සතුන්ගේ නිෂ්පාදනය කෙරෙහි වැඩි බලපෑමක් ඇති කරන දේශගුණික සාධක 2ක් ලියන්න.

b) සතුන් හා පරිසරය අතර තාප හුවමාරු කරගන්නා ආකාර 04 ක් ලියන්න.

c) ඉහත සඳහන් කළ ක්‍රම අතුරින් ගවයින් වැඩි වශයෙන් යොදා ගන්නා ක්‍රමය කුමක්ද ?

d) තාප හුවමාරුව හොඳින් සිදු කරගැනීම සඳහා දේශීය ගවයින් පෙන්වන රූපාණු විද්‍යාත්මක ලක්ෂණ ලියන්න.

e) අඩු උෂ්නත්ව තත්වයට ප්‍රතිචාර ලෙස සතුන් දක්වන හැසිරීමක් හා කායික ක්‍රියාවලි තත්ත්වයක් පිළිවෙලින් ලියන්න.

III.

a) සම්භවය අනුව කුකුළන් වර්ගීකරණය කර එම වර්ග සඳහා උදාහරණ දෙන්න.

b) බිත්තරයක කොටස් 4 ක් ලියා ඒවායින් ඉටුකරන කාර්යයන් එක බැගින් ලියන්න.

c) රක්කවීමට සුදුසු බිත්තරයක අභ්‍යන්තර ලක්ෂන 03 ක් ලියන්න.

d) කෘතිම බිත්තර රක්කවීමේදී හසුරුවන පරිසර සාදක මොනවාද?

e) කෘතිම බිත්තර රක්කවීමෙන් ලබා ගත හැකි වාසි මොනවාද ?

04. I.

a) පාංශු හායනය අර්ථ ගන්වන්න.

b) පාංශු හායනය කෙරෙහි බලපාන සාධක 04 ක් ලියන්න.

c) පාංශු පෝෂක හිඟවීමට බලපාන ප්‍රධාන කරුණක් ලෙස පාංශු ඛාදනය හැඳින්විය හැකිය. පාංශු ඛාදන කාරක 03 ක් ලියන්න.

The National e-learning Portal for The General Education

d) පාංශු ඛාදන ක්‍රියාවලිය පියවර 03 කින් ලියන්න.

e) පාංශු ඛාදනයේ අහිතකර බලපෑම් 03 ක් ලියන්න.

II. සිය වර්ධනය සහ පැවැත්ම සඳහා ශාක පරිසරයෙන් රසායනික ද්‍රව්‍යය අවශෝෂණය කර ගනී.

a) යම් මූල ද්‍රව්‍යයක් අත්‍යවශ්‍ය මූල ද්‍රව්‍යයක් ලෙස නම් කිරීමට හේතු 02 ක් දෙන්න.

b) අත්‍යවශ්‍ය මූල ද්‍රව්‍යය අතුරින් මහා මූල ද්‍රව්‍යය ලෙස සැලකෙන මූල ද්‍රව්‍යය නම් කරන්න.

....

....

....

....

c) ශාක වලට අවශ්‍ය මූල ද්‍රව්‍යය චල හා අචල ලෙස නැවත වර්ග කළ හැකිය.
එසේ වර්ග කිරීමේ පදනම කුමක්ද ?

....

....

....

....

d) N,P හා K පෝෂක ශාක අවශෝෂනය කරන ආකාර ලියන්න.

....

....

....

....

e) P පෝෂකයේ ශාක දක්වන ඌණතා ලක්‍ෂන ලියන්න.

....

....

....

....

III.

a) බෝග වගාව සඳහා බිම් සැකසීම යනු කුමක්ද ?

....

....

b) බිම් සැකසීමේ ප්‍රධාන අරමුණු ලියන්න.

....

....

....

....

c) ප්‍රාථමික බිම් සැකසීම යන්න හඳුන්වන්න.

....

....

d) ද්විතියික බිම් සැකසීම යන්න හඳුන්වන්න.

....

....

e) ප්‍රාථමික බිම් සැකසීමට හා ද්විතියික බිම් සැකසීමට යොදා ගන්නා උපකරණ වෙන වෙනම ලියන්න.

ප්‍රාථමික බිම් සැකසීම	ද්විතියික බිම් සැකසීම
....	....
....	....
....	....
....	....

e තක්සලාව අධ්‍යාපනය The National e-learning Portal for The General Education

රචනා

ප්‍රශ්න 03 කට පිළිතුරු සපයන්න.

01. i. බෑවුම් සහිත ඉඩම් සඳහා යෝග්‍ය පාංශු සංරක්ෂක ක්‍රම විස්තර කරන්න.
ii. ආම්ලික පසක පවතින කෘෂිකාර්මික ගැටළු හා එවැනි පසක් යථා තත්ත්වයට පත්කර ගත හැකි ආකාර සාකච්ඡා කරන්න
iii. බෝග වගාව සඳහා කාබනික පොහොර භාවිතය මඟින් ඇතිවන වාසිමය තත්ත්වයන් හා ගැටළු සාකච්ඡා කරන්න

02. i. බීජ සුප්තතාවය යනු කුමක්ද බීජ සුප්තතාවයට බලපාන සාධක මොනවාද
ii. රෝමාන්තික් සතකුගේ ආහාර ජීර්ණය සිදුවන ජීර්ණක ආකාර ලියා එම ජීර්ණයන් සිදුවීම සඳහා සතාගේ ආහාර මාර්ගයේ පවතින අනුවර්තන සාකච්ඡා කරන්න
iii. සත්ත්ව ගොවිපළ සනීපාරක්ෂාව සහ රෝග පාලන ක්‍රම සඳහන් කර එසේ රෝග පාලනයේ වැදගත්කම විස්තර කරන්න

03. i. කිකිලියන් පිටලෑම සිදුකරන අවස්ථා සඳහන් කර එසේ පිටලෑම මඟින් සිදුවන වාසිමය තත්ත්වයන් පහදන්න
ii. විවිධ බිම් සැකසීමේ ක්‍රම විස්තර කරන්න
iii. ජල සම්පාදන කාර්යක්ෂමතාවය ඉහළ නැංවීම සඳහා කල යුතු දේ සාකච්ඡා කරන්න

04. i. ලාභය උපරිම කිරීම අරමුණු කරගත් ගොවිපළ කළමණාකරුවකු නිතරම ක්‍රියාත්මක වන නිෂ්පාදන කලාපය ප්‍රස්ථාර සහිතව පැහැදිලි කරන්න
ii. කිරිවල සංයුතියට බලපාන සාධක උදාහරණ සහිතව පහදන්න
iii. බීජ ප්‍රතිකාර කිරීමේ අරමුණු පැහැදිලි කරන්න